**ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 ජනවාරි 10 දින රු.මිලියන 500 ක මුදලක් ලබාදී තිබූ අතර පොලියද එකතුව රු.517,421,448 ක් වූ මුදල ඉකුත් වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කපාහැර තිබුණි. මෙම ණය මුදල අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩුව සමථයකට පත්වී නොතිබූ අතර මෙම නඩුව පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදී ගිණුම් වල අදාල හෙළිදරව් කිරීමට කටයුතු කරණු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අසම්භාව්‍යයන් වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වැඩිපුර ගෙවූ සෙස් බදු වටිනාකම රු.30,000,000ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද රේගු දෙපාර්තමේන්තුවෙන් ලද 2023 සැප්තැම්බර් 29 දිනැති තක්සේරු දැන්වීම ප්‍රකාරව එම මුදල රු.33,000,000 ක් වූයෙන් රු.3,000,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුමේ පැවති 2023 වර්ෂය තුල ආයතනයට භාණ්ඩ ලැබී තිබූ ගණුදෙනු වේ. මේ නිසා මෙම අයිතමයන් සඳහා confirmation කැඳවූයේ නැත. එහෙත් අත්තිකාරම්වල 2024 වර්ෂයට GRN දැමීමට අවශ්‍ය භාණ්ඩද තිබුණි. ඉදිරි වර්ෂයේදී මෙවැනි ගැටලු ඇති නොවීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු සෙස් බදු නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | වෙරළ සම්පත් හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සමාගම වෙත ඛනිජ වැලි කැණීම සඳහා 2017 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට අදාලව නිකුත් කර තිබූ බලපත්‍ර 5 කට අදාළව කැණීම් කළ යුතු වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැලි කැණීම් කිරීම හේතුවෙන් එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.74,583,515 ක වටිනාකම වර්ෂ 5 කින් ගෙවීම සඳහා එකඟ වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.15,960,707 ක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණද ජංගම නොවන වගකීම් යටතේ දැක්විය යුතු රු.58,622,808 ක ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අංක 30 සටහන යටතේ වෙන්කිරීම් ලෙස දක්වා ඇති රු.15,966,703 ක මුදල අදාල වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ඛනිජ වැලි බලපත්‍ර ලබා ගැනීමේදී ගෙවීමට තිබූ මුදලේ වාර්ෂික වෙන්කිරීම වේ. | සියලු වගකීම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2023 දෙසැම්බර් 13 සිට 2024 දෙසැම්බර් 12 දක්වා ඛනිජ වැලි කියුබ් 30,000 ක් සඳහා රු.15,000,000 ක් ගෙවා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබා ගෙන තිබූ අතර සමාගම 2023 දෙසැම්බර් 31 දින දක්වා වැලි කියුබ් 287 ක් කැණීම් කර තිබුණි. ඉතිරි වැලි කියුබ් 29,713ක් සඳහා ගෙවූ රු.14,856,500 ක් කලින් ගෙවුම් ලෙස සටහන් කරනු වෙනුවට වියදමක් ලෙස සටහන් කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී පෙර වර්ෂයේ ලාභයට හා 2024 බලපත්‍ර ගාස්තු ගිණුමට අදාල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | කලින් ගෙවූ වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | 2021 හා 2022 වර්ෂවල පියවන ලද රු.2,109,897 ක් වූ ණය හිමි ශේෂ 24 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් ණය හිමි ශේෂය තුළ ඇතුළත් වී තිබීම හේතුවෙන් ණය හිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. | ණය හිමියන්ට ගෙවීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | ලැබිය යුතු පොලී ආදායම රු.314,586,495 කින් අඩු වීම හා අනෙකුත් ජංගම වත්කම් රු.42,928,783 කින් වැඩි වීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සිදු වූ ශුද්ධ බලපෑම වූ රු.271,657,712 ක මුදල් ගලා ඒම වෙනුවට රු.473,522,169 ක අගයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | අදාල නිවැරදි කිරීම් සිදු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ඊ) | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.24,805,590 ක බදු මුදල සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාගමට රු.24,805,590 ක් එනම් PAYE,VAT හා ESC බදු හිඟව පවතින බවට දැනුම් දී ඇත. අදාල ලේඛනයට අනුව 2012/13, 2014/15 වර්ෂයන් සඳහා ගෙවීමට ඇති හිඟ ආදායම් බදු ESC ද ඇතුළුව රු.23,118,196 කි. 2014/15 වර්ෂය සඳහා හිඟ බදු වලට අදාලව බදු අභියාචනා ඉදිරිපත් කර ඇති අතර අදාල අභියාචනා සඳහා තීරණය ලැබීමට නියමිතය. කෙසේ වුවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව VAT ආපසු ගෙවීම් වලින් හිඟ බදු වර්ෂය තුල හිලවු කරගෙන ඇත.ඒ අනුව ආදායම් බදු හා ESC සඳහා රු.23,118,196 ක් ද VAT සඳහා රු.1,596,306 ද හිලවු කරගෙන ඇත. මෙම නිසා එම මුදල ගිණුම් වල ගෙවිය යුතු ශේෂයක් ලෙස පෙන්විය නොහැක. | ගෙවිය යුතු බදු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 20 දිනැති අංක PED/P/2/25 (1) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව සංයුක්ත සමාජීය වගකීම්(CSR) සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.10,682,850 ක් ගෙවා තිබුණි. | ගාල්ල දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීමට අනුව දකුණු පළාතට ගංවතුර ආපදා සිදු වූ අවස්ථාවේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අමාත්‍යංශයේ එකගතාව මත රු.මිලියන 6ක වියලි සලාක ඇතුලත් භාණ්ඩ පාර්සල් 2000ක් ලබා දී ඇත. මේ සඳහා මහ භාණ්ඩාගාරයේ මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි 2023 කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත රු.මිලියන 5ක මුදලක් ලබා දී ඇත. මෙය සාමාජීය වගකීමක් නොවන අතර අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සේ සැලකිය යුතුය. ඉදිරි වර්ෂවලදී එවැනි ගණුදෙනු සම්බන්ධයෙන් නිවැරදි ආකාරයෙන් කටයුතු කරනු ලැබේ. | විධිමත් අනුමැතියක් මත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සාමාජීය වගකීම් (CSR) සඳහා වියදම් දැරිය යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 3.5 ඡේදය | සමාගමේ සේවයේ නියුතු සේවකයන් දෙදෙනෙකු 2022 ඔක්තෝබර් 17 දින හා නොවැම්බර් 29 දින සිට විධිමත් අනුමැතියකින් තොරව කර්මාන්ත අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර චක්‍රලේඛයට පටහැනිව ඔවුන් සඳහා සමාගම විසින් වැටුප්, අතිකාල දීමනා, අනෙකුත් දීමනා හා රු.293,500 ක් වූ නිෂ්පාදනය මත වූ දිරිදීමනා ද ඇතුළුව රු.3,818,937 ක් ගෙවා තිබුණි. | අප ආයතනයේ සේවකයින් දෙදෙනෙකු කර්මාන්ත අමාත්‍යාංශය වෙත නිදහස් කර ඔවුන් සඳහා වැටුප් හා දීමනා ගෙවන ලෙස කර්මාන්ත අමාත්‍යාංශය දැනුම් දි ඇත.කෙසේ නමුත් LMS/ET/A/50 හා 2023.11.16 දිනැතිව ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය අමතන ලද ලිපිය මඟින් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමටද කටයුතු කර ඇති අතර අදාල ලිපිවල පිටපත් ඇත.අමාත්‍යාංශය වෙත මේවන විට නිදහස් කොට ඇති රියදුරු මේවන විට ආපසු ගෙන්වා ගෙන ඇති අතර ප්‍රධාන කාර්යාලය තුල සේවයෙහි යොදවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නිදහස් කළ සේවකයන් නැවත සමාගම වෙත ගෙන්වා ගත යුතු අතර ගෙවූ වැටුප් හා දීමනා අමාත්‍යාංශයෙන් අයකර ගත යුතුය. |
| (ඇ) | 2004 මාර්තු 30 දිනැති අංක සීඊ/පීඩීසීබී/14/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | | | |

| | | |
|---|---|---|
| (i) පැමිණීමේ දීමනාව මසකට රු.500 ක් අනුමත කර තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත සමාලෝචිත වර්ෂය වන විට එය රු.3,000 ක් දක්වා වරින්වර වැඩි කර තිබුණු අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන කාර්යාල සේවකයන් සඳහා රු.3,327,600 ක්ද, පුල්මුඩේ යන්ත්‍රාගාර සේවකයන් සඳහා රු.15,326,870 ක්ද පැමිණීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. | අප විසින් මේවන විට ගෙවනු ලබන රු. 3,000 ක පැමිණීමේ දිමනාව පිළිබඳව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යවන ලද අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය එම දෙපාර්තමේන්තුව විසින් අප වෙත ලබාදී ඇති අතර අප විසින් යෝජනා කරන ලද පැමිණීමේ දීමනාව වැඩිකිරීමේ ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදී නොමැත. | භාණ්ඩාගාර අනුමැතිය මත දීමනා වැඩි කළ යුතුය. |
| (ii) ආහාර දීමනාව දිනකට රු.35 ක් අනුමත කර තිබියදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත සමාලෝචිත වර්ෂය වන විට දිනකට රු.200 ක් දක්වා වරින් වර වැඩිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන කාර්යාල සේවකයන් සඳහා රු.4,194,400 ක්ද පුල්මුඩේ යන්ත්‍රාගාර සේවකයන් සඳහා රු.246,920,100 ක්ද ආහාර දීමනා ලෙස ගෙවා තිබුණි. | අප විසින් මේවන විට ආහාර දිමනාව ලෙස දිනකට රු. 200ක් ලෙස ගෙවනු ලබන දිමනාව සඳහා අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ඇමතු අතර ඒ සඳහා එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර අප විසින් යෝජනා කරන ලද ආහාර දීමනාව වැඩිකිරීමේ ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදි නොමැත. | භාණ්ඩාගාර අනුමැතිය මත දීමනා වැඩි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) 9 ඡේදය | පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සැපයුම් නිලධාරී වෙත 2023 ජූනි 10 දින සිට 2023 දෙසැම්බර් 29 දින දක්වා අවස්ථා 11 කදී ලබාදුන් රු.735,175 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා නොතිබූ අතර එම ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබා දීමට කටයුතු කර තිබුණි. | යන්ත්‍රාගාරයේ සමහර නඩත්තු කටයුතු හා ලෝඩර් වල නඩත්තු කටයුතු ආදියට අත්තිකාරම් ලබා දේ. අත්තිකාරම් ලබාදීම සිදුවන්නේ බොහෝවිට විධායක නිලධාරියෙකුටය. යන්ත්‍රාගාරයේ හදිසි බිඳවැටීම් හා හදිසි අවශ්‍යතාවයන් සඳහා කලින් ලබා දුන් අත්තිකාරම් පියවීමට පෙර නව අත්තිකාරම් ලබා දීම සිදු වේ. එසේම අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයක් ද පවතින අතර මින් ඉදිරියට අත්තිකාරම් ලබා දීමේ හා පියවීමේ කටයුතු 1/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 9 ඡේදයට අනුව කටයුතු කරනු ලැබේ. ඒ අනුව දැනට අයකරගැනීමට ශේෂයක් නොමැත. | ලබාදුන් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබා නොදිය යුතුය. |
| (ii) 11 ඡේදය | 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණය සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | නොවැලැක්විය හැකි හේතූන් නිසා ස්ථාවර වත්කම් වාර්ෂික සමීක්ෂණය ප්‍රමාද වූ අතර 2024 ජූලි 15 සිට සමීක්ෂණය ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණය නියමිත දිනට සිදුකර අවසන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,050,724,331 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.6,160,424,037 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,109,699,706 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අනෙකුත් මෙහෙයුම් වියදම් රු.404,231,368 කින් අඩුවී මූල්‍ය ආදායම් රු.624,794,615 කින් වැඩිවී තිබුණද බෙදාහැරීමේ පිරිවැය, පරිපාලන පිරිවැය පිළිවෙලින් රු.62,634,849 කින් හා රු.13,993,174 කින් වැඩි වීම ද ආදායම රු.2,658,595,672 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා 2012 ඔක්තෝබර් 22 දින ඉදිරිපත් කළ අංක 12/1383/527/012-1 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා 2020 පෙබරවාරි 12 දිනැති අංක අමප/20/0226/224/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමුද්‍රව්‍ය ස්වරූපයෙන්ම ඛනිජ වැලි අපනයනය කිරීමෙන් තොරව අගය එකතු කරන ලද නිෂ්පාදන විදේශයන් වෙත යැවීමට සමාගම | අගය එකතු කිරීමේ ක්‍රියාවලයට අදාල Zircon Powder යන්ත්‍රාගාරය සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව සමාගමට ගැලපෙන යෝජනාවක් නොවන හෙයින් අදාල යෝජනාව TEC විසින් ප්‍රතික්ෂේප කරන ලදී.ඒ අනුව නැවත ටෙන්ඩර් කැඳවීමට සමාගම තීරණය කර ඇත.මේ වන විට මෙහි කටයුතු අමාත්‍යාංශය මට්ටමින් සිදු වෙමින් පවති. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය බව හඳුනාගෙන තිබුණද සමාගම විසින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දින වූ 2024 මැයි 31 දක්වා ගෙන නොතිබුණි. | | |
| (ආ) | 2020-2022 කාලපරිච්ඡේදය තුළ බාහිර පාර්ශවය වෙත ගෙවා තිබූ රු.1,322,750 ක් වූ අත්තිකාරම් ශේෂ 06 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය විසින් බාහිර පාර්ශවයන්ට ලබා දුන් අත්තිකාරම් හයක වටිනාකම වූ රු.1,322,750 ක වටිනාකමකින් යුත් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | බාහිර පාර්ශවයන්ට ගෙවූ අත්තිකාරම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර 3 ක් ඉක්මවූ රු.6,116,174 ක් වූ විවිධ ණය හිමි ශේෂ 126 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ද නිරවුල් කර නොතිබුණි. | 2021 ,2022 වර්ෂවල විවිධ ණය හිමියන් ශේෂ 126 සඳහා රු.6,116,174 ක් නිදහස් කිරීමට ඇත. AMC උපදෙස් පරිදි අදාල ණය හිමියන්ගෙන් ශේෂ තහවුරු කර අදාල තහවුරු කර ගැනීම් වලින් අනතුරුව ගෙවිය හැකි දෑ ගෙවීමට හා ඉතිරිය ආයතනයේ ගිණුමට බැර කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ පැවති රු.53,695,105 ක් වූ වීල් ලෝඩර් හතරක් හා රු.800,000 ක් වටිනා ලොරි රථයක් වසර 5 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව තබා තිබුණි. | යන්ත්‍රාගාර නිෂ්පාදන කාර්යය සඳහා මීට වර්ෂ කිහිපයකට පමණ පෙර භාවිතයට ගන්නා ලද මෙම ලෝඩර් රථ කිහිප අවස්ථාවක අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කලද, කෙටි කාලයක් තුල නැවත දෝෂයන්ට ලක්වීම හේතුකොට ගෙන තාවකාලිකව ධාවනයෙන් ඉවත් කරනු ලැබිය. | නිශ්කාර්යව පවතින වත්කම් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාගමේ වාර්ෂික ලාභයෙන් සියයට 5 ක් දිරි දීමනා ලෙස සේවකයන් අතර බෙදා දීමට 2005 පෙබරවාරි 14 දිනැති අංක DMS/IDEP/06/02 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් අනුමැතිය ලබාදී තිබුණි. ලාභය මත ගෙවනු ලබන එකී දිරි දීමනාව පිළිබඳව සඳහන් නොකර ඉල්මනයිට් නිෂ්පාදනය මත පදනම්ව දිරි දීමනාවක් ගෙවීම සඳහා 2022 අගෝස්තු 2 දින භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර තිබුණු අතර රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022 නොවැම්බර් 29 දිනැති අංක PED/I/LMSL/3(iii) දරන ලිපිය මගින් ඒ සඳහා අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වාර්ෂික ලාභය මත දිරි දීමනා ලෙස රු.193,679,110 ක්ද ඉල්මනයිට් නිෂ්පාදනය මත දිරි දීමනාව ලෙස රු.84,156,325 ක්ද ගෙවා තිබුණි. | ආයතනයේ වාර්ෂික ශුද්ධ ලාභය පදනම් කරගෙන ගෙවන ප්‍රසාද දීමනා ක්‍රමවේදය හඳුන්වා දී ඇත. මේ දීමනාව සියයට 5 දක්වා වැඩිකර ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/IDEP/06/02 දරන 2005.02.14 දිනැති ලිපිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. තවද 5%ක වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවීම්කරන්නේ ආයතනයේ සමස්ථ ශුද්ධ ලාභය පදනම් කරගෙන වන අතර නිෂ්පාදන දිරි දීමනාව හඳුන්වා දී ඇත්තේ එතෙක් පැවති ප්‍රවාහන දීමනාව ඒ නමින්ම අනුමත කර ගැනීමට නොහැකි වීම මත ඒ සඳහා නව ප්‍රායෝගික විසඳුමක් ලෙසය. | සමාගමේ දිරි දීමනා සඳහා නිවැරදි ක්‍රමයක් ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය ආරම්භයේ ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 105,282 ක් සමාගම සතුව පැවතුණු අතර වර්ෂයේදී සමාගමේ ඛනිජ වැලි මෙ.ටොන් 111,286 ක් නිෂ්පාදනය කර තිබුණි. ඉන් සියයට 30 ක ඛනිජ වැලි ප්‍රමාණයක් පමණක් වර්ෂය තුළ අලෙවි කර තිබුණි. රු.1,854,191,931 ක වටිනාකමකින් යුත් ඛනිජ වැලි මෙ.ටොන් 187,951 ක තොගයක් යන්ත්‍රාගාරයෙහි ගුදම් තුළ රඳවා ගෙන තිබූ අතර ගුදම් ධාරිතා මට්ටම ඉක්මවා යෑම හේතුවෙන් ඉල්මනයිට් නිෂ්පාදනය 2024 මැයි මස වන විට නවතා දැමීමට සිදු වී තිබුණි. ප්‍රධාන ඛනිජ නිෂ්පාදනය වූ ඉල්මනයිට් මෙ. ටොන් 53,856 ක් සමාලෝචිත වර්ෂය තුළ නිෂ්පාදනය කර වර්ෂය අවසානයේ මෙ.ටොන් 78,287 ක් ඉතිරිව තිබුණු අතර මෙම තොග අලෙවි කර ගැනීමට සුදුසු අලෙවි ප්‍රවර්ධන ක්‍රම සමාගම විසින් අනුගමනය කර නොතිබුණි. ඉල්මනයිට් නිෂ්පාදනය මත පදනම් වූ දිරි දීමනා ක්‍රමයක් සමාගම තුළ ක්‍රියාත්මක වීම මෙම අසාමාන්‍ය නිෂ්පාදනයට හේතු වූ බව බැහැර කළ නොහැකි විය. | | |
| (ඊ) | සමාගම සතුව වීල් ලෝඩර් යන්ත්‍ර 13 ක් පැවතුණද සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර 7 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර ඉතිරි යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. සේවයේ යෙදවූ යන්ත්‍ර 06 ද වර්ෂය තුළ පැය 17,343 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර සමාගම වීල් ලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරුවන් 21 දෙනෙකු සේවයේ යොදවා 2023 වර්ෂය තුළ රු.20,368,840 ක වැටුප්, දීමනා හා අතිකාල ලෙස ගෙවා තිබුණි. උපරිම ධාරිතාවයෙන් වීල් ලෝඩර් යන්ත්‍ර 7 ම සේවයේ යොදවා තිබියදී රු.12,400 ක පැයක රේටයකට කුලී පදනමට ගත් ලෝඩර් යන්ත්‍රයක් ද සේවයේ යොදවාගෙන තිබුණි. එම කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී පැයකට රු.9,500 ක් ඇස්තමේන්තු කර තිබියදී ඇස්තමේන්තුගත රේටයට වඩා රු.2,900 ක් වැඩි මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2023 නොවැම්බර් 17 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කුලී පදනමට ගත් වීල් ලෝඩරය පැය 817.9 ක් සේවයේ යොදවා රු.7,161,204 ක් ලෝඩර් යන්ත්‍ර සැපයුම්කරුට ගෙවා තිබුණි. | ස්ථිර ලෙස හානි වූ තත්වයේ පැරණි වීල් ලෝඩර් හයක් අප සතුව ඇත: PL-19, PL-21, PL-22, PL-23, PL-24, සහ PL-25. මෙම ලෝඩර් සියල්ලම ආසන්න වශයෙන් අවුරුදු 10 ක් පැරණි වන අතර සැලකිය යුතු අලුත්වැඩියාවක් අවශ්‍ය වේ. ඒ සඳහා සැලකිය යුතු පිරිවැයක් වැය වේ. ඒවායේ භාවිත කාලය සහ අවශ්‍ය අලුත්වැඩියාවන් සඳහා අධික වියදමක් දැරීමත් සමඟ මෙම ලෝඩර් සවිකිරීමට ආයෝජනය කිරීම පලක් නොවන බව පෙනේ. . | පවතින වීල් ලෝඩර් යන්ත්‍ර අවශ්‍ය පරිදි අලුත්වැඩියා කර උපරිම ධාරිතාවයෙන් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාගම සතුව පුල්මුඩේ, තෙවික්කල්ලු, පොඩුවාකට්ටු හා කෝකිලායි යන ප්‍රදේශවල හෙක්ටයාර 19.368 ක භූමි ප්‍රමාණයකට අදාළව කැණීම් බලපත්‍ර 4 ක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර තිබුණි. මේ යටතේ වර්ෂය තුළ දළ වැලි මෙට්‍රික් ටොන් 89,129 ක් පමණක් සමාගම විසින් කැණීම් කර තිබුණු අතර පුද්ගලික පාර්ශවයන් 5 ක් පුද්ගලික ඉඩම් වලින් කැණීම් කරන ලද දළ වැලි මෙට්‍රික් ටොන් 156,724 ක්ද රු.102,568,992 ක මුදලකට සමාගම වෙත සපයා තිබුණි. එම කැණීම් සඳහා ද සමාගමට නිකුත් කර තිබූ IML/A/HO/1623/LR/9 දරන කැණීම් බලපත්‍රයම උපයෝගී කරගෙන ඇති බව සමාගම විගණනයට දන්වා තිබුණි. සමාගමට අවශ්‍ය ඛනිජ වැලි කැණීම් කර ගැනීම සඳහා අවශ්‍ය අවසරය ලබාදී තිබියදී හා අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් අයුරින් තිබියදී බාහිර පුද්ගලයන් වෙතින් වැලි මිලදී ගැනීමට කටයුතු කිරීම මතභේදයට තුඩුදී තිබුණි. | සමාගම සතුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් නිකුත් කරන ලද බලපත්‍ර 4 ක් පවතින අතර එම බලපත්‍ර පුල්මුඩේ, පොඩවකට්ටු, තෙවික්කල්ලු සහා කෝකිලායි ප්‍රදේශයන් සඳහා නිකුත් කරන ලදි. මෙම බලපත්‍ර නිකුත් කිරිමේදි අභ්‍යන්තරව මීටර් 4 ක් දක්වාද වෙරළ තීරය හා ගොඩබිම දෙසට මීටර් 100ක් දක්වා දුරක් සඳහා ද කැණීම් කිරිමට අවසර ලබා දී ඇත. පොඩවකට්ටු හා තෙවික්කල්ලු යන ප්‍රදේශයන් තුල කැණීම් සිදු නොකරන ලදි. පුල්මුඩේ වෙරළ තීරය ආශ්‍රිතව පුද්ගලික සැපයුම් කරුවන්ගෙන් වැලි ලබා ගැනිමේදි එම සැපයුම් කරුවන්ගේ අදාල ඉඩම් බලපත්‍ර සීමා තුල එනම් මීටර 100 සීමාව තුල පිහිටා තිබූ බැවින් නැවත ඒ සඳහා බලපත්‍ර ලබා ගැනීමෙ අවශ්‍යතාවයක් මතු නොවේ. එම ඉඩම් තුල ඉහල බර ඛනිජ වැලි සාන්ද්‍රණ මට්ටමක් පැවතීම හේතුවෙන් එම ඉඩම් හිමිකාරිත්වයේ පූර්ණ එකගතාවය මත කුච්චවේලි ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතිය මත නිවැරදිව හා ඵලදායි ආකාරයට සමාගම මගින් අදාල කැණීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදි. | පුද්ගලික ඉඩම් කැනීම් සිදු කිරීමේදි නිවැරදි රේටයන් භාවිතා කල යුතුය. |
| (ඌ) | වෙළඳ හා අනෙකුත් ණය හිමි ගිණුමේ ඇතුළත් 2013, 2015, 2016 වර්ෂවලට අදාළ රු.3,888,487 ක ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් වූ රඳවාගැනීම් (Retention) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2013,2015,2016 වර්ෂවල යන්ත්‍රාගාරයේ සිදුකළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කොන්ත්‍රාත්කරුවන්ට තවදුරටත් මුදල් ගෙවීමට පවතී. ඒවායේ පවතින ගැටළු නිසා අවසාන ගෙවීම් සිදුකර ගැනීමට නොහැකි වී ඇති අතර එම නිසා රදවාගත් මුදල් නිදහස් කර ගැනීමට නොහැකි වී ඇත. | අදාළ කාර්යය අවසන් වූ බවට සහතික කර රඳවා ගැනීම් නිරවුල් කළ යුතුය. |
| (එ) | නිසි මූල්‍ය කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී ලබාගත් බැංකු අයිරා හේතුවෙන් රු.4,360,217ක අයිරා පොලියක් ගෙවීමට සිදුව තිබුණි. | 2013,2015,2016 වර්ෂවල යන්ත්‍රාගාරයේ සිදුකළ ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කොන්ත්‍රාත්කරුවන්ට තවදුරටත් මුදල් ගෙවීමට පවතී. ඒවායේ පවතින ගැටළු නිසා අවසාන ගෙවීම් සිදුකර ගැනීමට නොහැකි වී ඇති අතර එම නිසා රදවාගත් මුදල් නිදහස් කර ගැනීමට නොහැකි වී ඇත. | නිසි මූල්‍ය කළමනාකරණයක් අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022-2026 කාලපරිච්ඡේදය තුළ මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි හි නව යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා 2013 පෙබරවාරි 13 දින රු.මිලියන 2.25 කට හෙක්ටයාර 17.69 ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. යන්ත්‍රාගාර කටයුතු සැලසුම් කිරීමට පෙර එම වර්ෂයේදීම රු.39,339,472 කට සර්පිලාකාර යන්ත්‍රයක් (Spiral Machine) මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නිෂ්කාර්යව තබා තිබුණි. කෝකිලායි යන්ත්‍රාගාරය සඳහා 2015 වර්ෂයේදී සේවකයන් 117 ක් බඳවාගෙන තිබුණු ද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර එම බඳවාගත් සේවකයන් පුල්මුඩේ යන්ත්රාගාරයේ සේවය සඳහා යොදවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2023-2026 කාලය තුළ ඉල්මනයිට් මෙ.ටොන්100,000 ක් නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන කෝකිලායි ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට සමාගම සැලසුම් කර තිබුණ ද ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ පියවර ගෙන නොතිබුණි. | කෝකිලායි කැණීම් බලපත්‍රය කඩිනමින් ලබාගැනීමේ බලාපොරොත්තුව මත මෙම යන්ත්‍ර ඇනවුම් කර මෙම ස්පයිරල් යන්ත්‍ර යන්ත්‍රාගාරයේ නිෂ්කාර්යව තිබීම වැළැක්වීම පිණිස පුල්මුඩේ යන්ත්‍රාගාරයේ ස්ථාපිත කරන ලදි. එකී ස්පයිරල් සවි කල පසු මෙම යන්ත්‍ර වලද යම් දෝෂයන් මතු වූ අතර එය මේවන විට අදාල මව් සමාගම සමඟ සාකච්ඡා කර එම දෝෂය පිලිසකර කරගනිමින් පවතී.2015 වර්ෂයේ බඳවාගත් සේවකයන් 117 දෙනා මේවන විට යන්ත්‍රාගාර සමස්ථ සේවකයින් විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හා සේවයෙන් පහකිරීම ආදී හේතූන් මත පුරප්පාඩු වූ කම්කරු තනතුරු රාජකාරි සඳහා යොදවා ඇති අතර ඒ අනුව යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ක්‍රියාවලියට යොදවා ඇති බැවින් ඔවුන් ආයතනික නිෂ්පාදනය සඳහා දායක කරගෙන ඇත.යන්ත්‍රාගාරය ඉදිකිරීමට යෝජිත භූමිය පස් සහ බොරළු යොදා සංවර්ධනය කර ඇත.තවද මෙම ව්‍යාපෘති යෝජනාව සහ ව්‍යාපාර සැලැස්ම අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | කෝකිලායි ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතුය. |
| (ආ) | ඉදිරි වර්ෂ 20 සඳහා කැණීම් සැලැස්මක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඉල්ලුම් කළ නව ගවේෂණ බලපත්‍ර 7 ක් සඳහා වූ අයදුම්පත් 2023 මැයි 25 වන දින ප්‍රතික්ෂේප කර තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මක කැණීම් බලපත්‍ර අලුත් කරමින් කැණීම් සිදුකිරීම හැර ගවේෂණ කිසිවක් සිදුකරනු නොලබයි. | මෙම ප්‍රදේශ කඩිනමින් නිදහස් කර ගැනීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇත. ඉදිරියේදි ඊට අවශ්‍ය ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ අමාත්‍යාංශය විසින් දැනුවත් කරනු ඇත. තවද ඛනිජ වැලි ගවේශණ බලපත්‍ර 7ක් ලබා ගැනීමට අදාල අයදුම් පත්‍ර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙත මීට වසර දෙකකට පමණ පෙර භාර දුන් අතර ඊට අදාල අනුමැතිය මේ වෙන තෙක් ලැබී නොමැති අතර මේ වනවිට ඊට අදාල Grid නව රෙගුලාසි මත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මඟින් පෞද්ගලික ආයතන වෙත ලබාදීමේ කටයුතු සිදුකරමින් පවතී. | කැණීම් සැලැස්මක් සකස් කර ගවේෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොඩුවාකට්ටු ප්‍රදේශයේ හෙක්ටයාර 0.5041 ක ඉඩමක ඛනිජ වැලි කැණීම් කිරීම සඳහා ලබාගත් බලපත්‍ර කිසිදු කැණීම් කටයුත්තක් සිදුකර හෝ බලපත්‍රය අලුත් කර හෝ නොතිබු බැවින් අවලංගු වී තිබුණු අතර ඒ සඳහා වැයකළ රු.1,284,500 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | IML/A/HO/N/14732 දරණ බලපත්‍රය යටතේ කිහිප අවස්ථාවක අදාල භූමිය තුලින් දළ වැලි ඉවත් කර ගැනීමට කටයුතු සැලසුම් කිරීමේදී අදාල ප්‍රදේශයේ ජනතාවගෙන් දැඩි විරෝධතාවය එල්ල වීම මත එම කටයුතු නවතා දැමීමට සමාගමට සිදු විය. තවද මෙම ප්‍රදේශය මීටර් 300ක් දක්වා ආවරණය වන පරිදි IEE කර ඇති බැවින් කැණීම් බලපත්‍ර ලබාගැනීම සඳහා පෞද්ගලික හා රජයේ ඉඩම් මොනවාදැයි හඳුනාගෙන ඊට අදාල සිතියම් ලබාදී පෞද්ගලික ඉඩම් හිමියන්ගේ කැමැත්ත මත ප්‍රාදේශීය ලේකම්ගේ කැමැත්ත ලබාගැනීමෙන් පසු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බලපත්‍ර ලබාගත හැක. | බලපත්‍ර විධිමත් පරිදි උපයෝජනය කර කැණීම් සිදුකළ යුතුය. |
| (ඇ) | 2018 අගෝස්තු සිට 2028 අගෝස්තු දක්වා වූ වසර 10 ක වලංගු කාල සීමාවක් සඳහා පොඩුවාකට්ටු සහ තෙවික්කල්ලු යන ප්‍රදේශ වල ඛනිජ වැලි කැණීම් සඳහා ලබාගෙන තිබූ කැණීම් බලපත්‍ර 02 යටතේ සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු කැණීම් කටයුත්තක් සිදුකර නොතිබුණි.තවද කෝකිලායි සිට කොක්කුතුඩුවායි දක්වා වන මුහුදු වෙරළේ හෙක්ටයාර 1.368 ක ඛනිජ වැලි කැණීම් කිරීම සඳහා 2023 සැප්තැම්බර් 08 දින සිට 2024 සැප්තැම්බර් 07 දක්වා කාලය සඳහා රු. 18,395,247 ක් වැය කර බලපත්‍රයක් ලබාගෙන තිබුණද විගණිත දිනවූ 2024 මැයි 31 දක්වා කිසිදු කැණීම් කටයුත්තක් සිදුකර නොතිබුණි. | අංක IML/ A/ HO-4047/ LR-7 දරණ පොඩවකට්ටු ප්‍රදේශය සඳහා ලබා ගෙන ඇති බලපත්‍රය යටතේ හෙක්ටයාර 06 ක භූමි ප්‍රමාණයක් වෙනුවෙන් බලපත්‍ර ලබා ගෙන ඇත. මෙම බලපත්‍රය යටතේ ලබා දී ඇති මීටර් 100 සීමාව මීටර් 300 දක්වා දිර්ඝ කර ගැනීම උදෙසා EIA සිදුකල අතර එම ප්‍රදේශයේ පවතින රාජ්‍ය හා පෞද්ගලික අංශය සතු ඉඩම් හඳුනා ගැනීම පිණිස පලමුව මැනුම් කටයුතු සිදු කල යුතුව ඇත. අංක IML- A- HO-4048-LR7 දරණ බලපත්‍රය තෙවික්කල්ලු ප්‍රදේශය ආවරණය වන පරිදි සමාගම මගින් ලබා ගෙන ඇත. මෙම මීටර් 100 සීමාව මීටර් 300 දක්වා වැඩි කර ගැනීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් IEE සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. මෙම ප්‍රදේශයේ පවතින රජය සතු ඉඩම් කඩිනමින් ලබා ගැනීමට එම ඉඩම් හිමි රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කරමින් පවතින අතර එම ආයතන වල අනුමැතිය ලැබීමෙන් පසු මෙම ප්‍රදේශය තුල කැණීම් ආරම්භ කරනු ඇත.වෙරළ තීරය තුල ක්‍රියාත්මක ධීවර කටයුතු වලට බලපෑම් එල්ල වන බව හුවා දක්වමින් ධීවර ප්‍රජාවගෙන් එල්ල වූ විරෝධය මත එම කටයුතු තාවකාලිකව නවතා දැමීමට සිදු විය. | බලපත්‍ර විධිමත් පරිදි උපයෝජනය කර කැණීම් කටයුතු සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2018 අගෝස්තු 15 සිට 2028 පෙබරවාරි 20 දින දක්වා වලංගු වන පරිදි පුල්මුඩේ ග්‍රාම සේවා වසමේ අරිසිමලේ, ජින්නාපුරම් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා ලංකා මිනරල් සෑන්ඩ් සමාගම වෙත අංක IML/A/HO/1623/LR/9 දරන කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. මෙම බලපත්‍රයේ සඳහන් කැණීම් භූමියේ මායිම්වලට අදාළ භූගෝලීය ඛණ්ඩාංක සීමාවෙන් පිටත අනවසර කැණීම් සිදුකර ඇති බවට එම කාර්යාංශය 2023 සැප්තැම්බර් 21 දින සිදුකළ වැටලීමේදී අනාවරණය කර ගෙන තිබුණි. එහිදී පාරිසරික වශයෙන් ආරක්ෂා කරගත යුතු සංවේදී කලාප ලෙස හඳුනාගෙන ඇති කෝකිලායි කලපුවේ සිට පුල්මුඩේ රන්වැලි නාවුක හමුදා කඳවුර දක්වා වූ මෝය රක්ෂිත ප්‍රදේශය අනවසරෙන් සමාගම විසින් කැණීම් කර තිබුණි.<br>මෙකී කැණීම් බලපත්‍රය මත සිදු කිරීමට පෙර ලබා ගත යුතු වෙරළ සංරක්ෂණ බලපත්‍රයෙහි වලංගු කාලය 2023 අගෝස්තු 21 දිනෙන් අවසන්ව තිබුණද සමාගම එදිනෙන් පසුවද දළ වැලි මෙ.ටොන් 9,623 ක් කැණීම් කර තිබුණි. | 2023 සැප්තැම්බර් 21 දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලංකා මිනරල් සෑන්ඩ්ස් ආයතනය බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් කැණීම් භී වැටලීම කරන නිලධාරියා දැනුවත්ව තිබුනේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් නිකුත් කල මුල් බලපත්‍රය සම්බන්ධයෙන් පමණක් වන අතර,ඊට මාස 06කට පසුව අදාල මුල් බලපත්‍රය සංශෝධනය කරමින් නිකුත් කරන ලද අංක IML/A/HO/1623/LR/9 දරණ 2018.08.15 දිනැති ලිපිය සම්බන්ධයෙන් ඔහු දැනුවත් වී නැත. ඒ අනුව අදාල කාර්මික කැණීම් බලපත්‍රය 2018.02.20 දින නිකුත් කරන ලද අවස්ථාවේ හෙක්ටයාර 07 කට මීටර 30 ක් පළලට කැණීම් බලපත්‍රය නිකුත් කර ඇත. එහෙත් පසුව පැවති ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී කැණීම් පළල මීටර 100 ක් දක්වා පුළුල් කිරිමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අංක IML/A/HO/1623/LR/9 දරණ 2018.08.15 දිනැති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් කැණීම් ප්‍රදේශය නැවත යථාතත්වයට පත් කර හෙක්ටයාර් 18ට පුළුල් කර මීටර 30ක් වූ පළල මීටර 100ක් දක්වා වැඩි කර ඇත. | බලපත්‍රයේ සඳහන් මායිම තුළ කැණීම් සිදුකළ යුතුය. |
| (ඊ) | ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරි කර ගැනීම සඳහා ඩ්‍රයර් යන්ත්‍රයක් 2016 ජුනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.45,120,142 ක් ගෙවා තිබුණු අතර එම යන්ත්‍රය ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් කර භාවිත කිරීමට කටයුතු කර නොතිබුණි. | වියලන යන්ත්‍රය ක්‍රියාත්මක මට්ටමක පවත්වා ගැනීම වෙනුවෙන් කටයුතු ආරම්භ කල අතර ඒ සඳහා දේශිය සමාගම් 03 ක් තෝරා ගන්නා ලදි. එම සමාගම් 03 විසින් වියලන යන්ත්‍රයේ Burner, මෘදුකාංගය සහ යාන්ත්‍රික කොටස් මේ වන විට සවි කර ඇති අතර ඉදිරි සති කිපය තුල commissioning කිරිමෙන් පසු Zircon නිෂ්පාදනය සඳහා දායක කරගනු ලැබේ. | විධිමත් ගිවිසුම් වලට එළඹි යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |
| (උ) | කැණීම් කරනු ලබන ඛනිජ වැලි වල ගුණාත්මකභාවය වැඩි කිරීම, අනවශ්‍ය ප්‍රවාහන හා මෙහෙයුම් පිරිවැය අඩු කිරීම අරමුණු කරගෙන රු.264,784,592 ක් වටිනා ජංගම යන්ත්‍රාගාර (Mobile Plant) දෙකක් 2022 නොවැම්බර් මාසයේ සමාගම විසින් මිලදී ගෙන තිබුණු අතර රු.159,345,049 ක් වටිනා එක් යන්ත්‍රයක් 2023 ක්‍රියාකාරී සැලැස්මට අනුව | පොඩවාකට්ටු ප්‍රදේශය තුල අනෙක් යන්ත්‍රාගාරය ස්ථාපනය කිරිම සඳහා ඉඩමක් නිදහස් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් තැනගේ උපදෙස් මත ප්‍රදේශයේ පවතින රාජ්‍ය ආයතන තුලින් No objection letter ලබා ගන්නා ලදි. ඒ අනුව ඉදිරි සති කීපය තුල ප්‍රාදේශිය ලේකම්ගේ අනුමැතියට යටත්ව මෙම යන්ත්‍රාගාරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට | මිලදී ගත් යන්ත්‍රය ස්ථාපිත කර අරමුණු ඉටුකර කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පොඩුවාකට්ටු ව්‍යාපෘතිය තුළ ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද 2024 අප්‍රේල් 30 දින වන විටත් ස්ථාපනය නොකර පරිශ්‍රය තුළ නිෂ්කාර්යව පැවතුණි. | බලාපොරොත්තු වේ. | |
| (ඌ) | අනෙකුත් ජංගම වත්කම් ලෙස දක්වා තිබූ 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු රු.102,010,243 ක එකතු කළ අගය මත බදු වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023/01/01 දිනට අයකරගත යුතු VAT ආපසු ගෙවීම් ශේෂය රු. 132,923,572 කි. 2023 වර්ෂය තුල රු.33,634,766 ක් වටිනා එකතුකල අගය මත බදු ආපසු ගෙවීම් ලබාගෙන ඇත.මෙයින් රු.23,657,840 ක මුදලින් ගෙවිය යුතු බදු සඳහා හිලවුකරගෙන ඇති අතර රු.9,976,926 ක මුදලක් ඉඩදිය නොහැකි VAT බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කපා හැර ඇත.ඉතා ඉක්මනින් ඉතිරි බදු බැදියාව නිරවුල් කර ගැනිමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු බදු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී සමාගමේ විද්‍යාගාරය තුළ සිදුකරන ලද නියැදි පරීක්ෂණ ප්‍රතිඵලයට අනුව දළ වැලි තුළ අන්තර්ගත ඛනිජ වැලි ප්‍රතිශතය සියයට 39 කට අඩු අගයක තිබූ අතර “Block A” යන්ත්‍රාගාරය මගින් Tailings (සුදු වැලි) වශයෙන් සියයට 42 සිට 57 දක්වා ප්‍රමාණයක් ඉවත් කර තිබූ බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂය තුල පුල්මුඩේ වෙරළ තීරය ආශ්‍රිතව පමණක් දීර්ඝ කාලීනව දළ වැලි කැණීම් සිදු කිරීම නිසා මෙම තත්වය හට ගෙන ඇත. මෙහි දක්වා ඇති ඛනිජ ප්‍රතිශතය තුලින් 2023 වර්ෂය තුල ඉල්මනයිට් මෙ.ටොන් 53856,රුටයිල් මෙ.ටොන් 2350.25 , හයිටයි ඉල්මනයිට් මෙ. ටොන් 1899.50 සහා සර්කොන් මෙ. ටොන් 556.04 ක නිෂ්පාදනයක් බිහි කර ගැනීමට සමාගමට හැකි විය. | නව කැනිම් භූමි හදුනාගත යුතුය. |
| (ඒ) | යාන්ඔය ප්‍රදේශයේ පිහිටා ඇති අබලන් තත්ත්වයේ පැවති නිල නිවාසයක් සභාපති නිල නිවාසය ලෙස සමාගම විසින් 2021 මාර්තු 12 දිනැති අංක 2021/298/12 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව 2021 හා 2022 වර්ෂයන්හිදී රු.9,393,420 ක් වැය කර අලුත්වැඩියා කර තිබුණද මෙම නිල නිවාසය කිසිදු කාර්යයකට භාවිත නොකර නිෂ්කාර්යව තබා තිබුණි. | යාන් ඔය ඉඩමේ ඔප්පු අස්ථානගත වීම හේතුවෙන් ඉඩමේ හිමිකම සනාථ කිරීමට නොහැකි විය. මෙය නීත්‍යානුකූලව සංචාරක බංගලාවක් ලෙස පවත්වාගෙන යාමට නොහැක. එබැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු සිදු කරමින් සිටී. මේ වන විටත් යාන් ඔය බංගලාව කාර්ය මණ්ඩලයට සහ ආයතනයට සේවා සපයන්නන් වෙත මුදල් අය කිරීමේ පදනම මත ලබාදීමට කටයුතු කර ඇත. ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමෙන් පසුව පරිසර හිතකාමී සංචාරක නිවාසයක් ලෙස විදේශීය සංචාරකයින් වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. | නිල නිවස ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන පිරිවැයට ගලපා තිබූ තොග ඌණතාවය හා අතිරික්තය පිළිබඳ වූ සමාගමේ ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරවු කර නොතිබුණි. | නොවැලැක්විය හැකි හේතූන් නිසා ස්ථාවර වත්කම් වාර්ෂික සමීක්ෂණය ප්‍රමාද වූ අතර 2024 ජූලි 15 සිට සමීක්ෂණය ආරම්භ කිරීමට කටයුතු කර ඇත. | තොග ප්‍රතිපත්ති නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව කළමනාකාර සේවා ගණයට (MM) අයත් තනතුරු දෙකක සේවයේ නියුක්ත අලෙවි කළමනාකාර සහ රසඥ යන නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (HM) අයත් රු.120,175 බැගින්ද, කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (JM) අයත් තනතුරක් වන පරිපාලන නිලධාරී තනතුරක සේවයේ නියුක්ත නිලධාරියෙකු සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (HM) අයත් රු.105,760 බැගින්ද වැටුප් ගෙවා තිබුණි. තවද, කණිෂ්ඨ කළමනාකාර සේවා ගණයට (JM) අයත් තනතුරු 3 ක සේවයේ නියුක්ත අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකුට, සැපයුම් නිලධාරීවරයෙකුට සහ ගිණුම් නිලධාරී වරයෙකුට කළමනාකරණ සේවා ගණයට (MM) අයත් පිළිවෙලින් රු.71,050 ක්, රු.72,425 ක්, රු.71,050 ක් හා රු.69,675 ක් වන පරිදි වැටුප් ගෙවා තිබුණි. | වැටුප් සැකසීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර, එහි වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි අදාල නිලධාරීන්ට අගතියක් නොවන අයුරින් තවදුරටත් කටයුතු කිරීමේ අරමුණින් අංක. LMS/ET/P/වැටුප් විෂමතා දරණ 2024.06.06 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා ඇත.<br>එම ලිපියට ලැබෙන උපදෙස් ප්‍රකාරව ඉදිරි තීරණ සඳහා යොමුවීමට නියමිතය. | අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව බඳවා ගැනීම් නොකළ යුතු අතර නියමිත වැටුප් පරිමාණයන්ට අනුකූලව අදාළ වැටුප් තලයන්හි පිහිටුවිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකල කාර්යභාරය ඇතුළත් කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්‍යසාධන වාර්තාව ඉදිරිපත් කර ඇත. | කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |